# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2008 අංක 10 දරන මුද්දර ගාස්තු
# (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2008 පෙබරවාරි මස 29 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2008 පෙබරවාරි මස 29 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 4.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2008 අංක 10 දරන මුද්දර ගාස්තු
## (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2008 පෙබරවාරි මස 29 වන දින]

එල්. ඩී.— ඕ. 68/2007

**2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් පනවනු ලැබේ :—

1. (1) මේ පනත 2008 අංක 10 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

(2) මේ පනතේ විධිවිධාන සියලු කාර්ය සඳහා 2008 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

2006 අංක 12 දරන පනතේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" (1) එහි (ඇ) ඡේදයේ "ණය කාඩ්පත දරන්නා විසින්; සහ" යන වචන වෙනුවට "ණය කාඩ්පත දරන්නා විසින්"; යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ඇඇ) ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ලෙස ක්‍රියා කිරීම සඳහා වන අධිකාරී පත්‍රයක් සම්බන්ධයෙන්, නොතාරිස් ධුරය සඳහා ඉල්ලුම් කරන තැනැත්තා විසින්;

(ඇඇඇ) බලපත්‍රයක් සම්බන්ධයෙන් එම බලපත්‍රය ඉල්ලුම් කරන තැනැත්තා විසින්; සහ".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"මුද්දර ගාස්තු ගෙවිය යුතු ආකාරය.

8. (1) 7 වන වගන්තිය ප්‍රකාර මුද්දර ගාස්තු සමථයකට පත්කර ඇති අවස්ථාවක හැර, නිශ්චිතව සඳහන් යම් සාධන පත්‍රයක් සඳහා අය කළ යුතු මුද්දර ගාස්තුව එම සාධන පත්‍රය ලියා අත්සන් කිරීමට

2—PL 002813—6,150 (2008/02)

පෙර හෝ ලියා අත්සන් කරන අවස්ථාවේ දී හෝ නියම කර ඇති වටිනාකමින් යුත් ඇලවිය හැකි මුද්දර ඇලවීමෙන් ගෙවනු ලැබිය යුතු ය. ගෙවන ලද මුද්දර ගාස්තුව එසේ ලියා අත්සන් කරන ලද සාධන පත්‍රය මත නිශ්චිතව දැක්විය යුතු ය :

එසේ වුව ද, ශ්‍රී ලංකාවේ ලියා අත්සන් කරනු ලබන කොටස් පැවරීම් සඳහා, එසේ ලියා අත්සන් කිරීමේ දින සිට එක් මාසයක් ඇතුළත එම මුද්දර ගාස්තුව ගෙවනු ලැබිය යුතු ය.

(2) යම් නිශ්චල දේපළක් උකස් කිරීමකට හෝ බදු දීමකට අදාළ යම් නිශ්චිතව සඳහන් සාධන පත්‍රයක් මත ගෙවිය යුතු මුද්දර ගාස්තුව එම නිශ්චිතව සඳහන් සාධන පත්‍රය ලියා අත්සන් කිරීමට පෙර හෝ ලියා අත්සන් කරන අවස්ථාවේ දී හෝ නියමිත බැංකුවකට ගෙවිය හැකි ය. කෙසේ වුවද මුද්දර ගාස්තුව ගෙවිය යුතු තැනැත්තාගේ පාලනයට යටත් නොවන හේතුවක් නිසා, එසේ මුද්දර ගාස්තුව ගෙවීමට නොහැකිව ඇති අවස්ථාවක, සාධන පත්‍රය ලියා අත්සන් කිරීමේ දින සිට දින හතක් ඇතුළත මුද්දර ගාස්තුව නියමිත බැංකුවට ගෙවිය යුතු ය. එම බැංකුව විසින් ඉන්පසු එම මුද්දර ගාස්තුව නිසි පරිදි ගෙවූ බවට දැක්වෙන නියමිත ආකෘතියෙහි වූ සහතිකයක් නිකුත් කළ යුතු අතර, එම සහතිකය අදාළ සාධන පත්‍රයෙහි අලවනු ලැබිය යුතු ය.

(3) යම් නිශ්චිතව සඳහන් සාධන පත්‍රයක් ලියා අත්සන් කරන ලද තැනැත්තකු එසේ ලියා අත්සන් කරන අවස්ථාවේ දී එම නිශ්චිතව සඳහන් සාධන පත්‍රය මත ලස් තැබූ මුද්දරයක් මගින් මුද්‍රා තබා නොමැති අවස්ථාවක එම මුද්දර නැවත පාවිච්චි කිරීම වැළැක්වීම සඳහා සෑම මුද්දරයක් මත හෝ හරහා ම තම නම තීන්තෙන් ලිවීමෙන් හෝ කෙටි අත්සන් යෙදීමෙන් එම මුද්දර අවලංගු කරනු ලැබිය යුතු ය. තව ද එම නිශ්චිතව සඳහන් සාධන පත්‍රය රුපියල් පනහක හෝ ඊට වැඩි වටිනාකමකින් යුතු ඇලවෙන මුද්දරයක් අලවා ඇති සාධන පත්‍රයක් වන විට එම මුද්දර කැපීමෙන් හෝ සුදුසු උපකරණයකින් විදීමෙන්

සිදුරු කර, එම නිශ්චිතව සඳහන් සාධන පත්‍රය ලියා අත්සන් කරන තැනැත්තා විසින් අවලංගු කළ යුතු ය.

(4) (3) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි අවලංගු කර නොමැති ඇලවිය හැකි මුද්දරයක් අලවා ඇති සාධන පත්‍රයක් එම මුද්දරයේ වටිනාකමෙහි ප්‍රමාණයට මුද්දර අලවා නොමැති සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය".

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.